1st Place Winner
National Productivity
Award 2020

SLAB ACCREDITED ISO/IEC 17021 QMS-001-01

SLSI SYSTEM CERTIFIED ISO 9001

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024.07.31 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛය / උපදෙස් ලිපිය 2024.07.29 දින සිට දකුණු පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය 2024.07.29 දින ලබා දී ඇති බව සහතික කරමි. ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / පරිපා.

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 01/2024

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**දිගු කලක් තිස්සේ අයකර ගත නොහැකිව පවතින රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දෙන ණය හා අත්තිකාරම් ණය ශේෂ අත්හැර දැමීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113 වන රෙගුලාසිය යටතට 113 (6) යනුවෙන් උප වගන්තියක් ඇතුළත් කරමින් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති, 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අදාළ වගන්තිය නැවතත් සංශෝධනය කරමින්, භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2024.05.29 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 04 කරුණ (අන්තර්කාලීන විධි විධාන) යටතේ දක්වා ඇති පරිදි, **දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම කළ නොහැකිව පවතින, දිගු කලක් තිස්සේ අය නොවී පවතින රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දෙන ණය හා අත්තිකාරම් ණය ශේෂ** අත්හැර දැමීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම සිදු කළ නොහැකිව පවතින, දිගු කලක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැර දැමීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා පහත සඳහන් විශේෂිත සීමා යටතේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ ගණන් දීමේ නිලධාරීන් වෙත මෙයින් බලය පවරනු ලැබේ. **මෙම ණය ශේෂ නිරවුල් කිරීමට/ කපා හැරීමට/ අත්හැරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සිය පෞද්ගලික අවධානය යොමු කළ යුතු අතර,** ඒ සඳහා වන නියෝග ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු හෝ වෙනත් අදාළ නිලධාරීන් වෙත ලිඛිතව ලබා දිය යුතු ය. මෙම විශේෂිත සීමාවන් 2024.12.31 දින දක්වා බලපැවැත්වෙන බැවින්, ණය ශේෂ අත්හැරීමේ කටයුතු එදිනට පෙර අවසන් කළ යුතු අතර, අත්හැර දමන ණය ශේෂ පිළිබඳ විස්තර 2025.01.31 දිනට පෙර පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) ට ද පිටපත් සහිතව පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ (මුදල්) වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු ය.

**අදාළ ණය අයකර ගැනීම නතර වී,**

| | |
|---|---|
| (i) අවුරුදු 5ට වඩා අඩු කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධරයා සම්බන්ධයෙන් ණය ශේෂය රු.25,000/- ක් නොඉක්මවන පරිදි |
| (ii) අවුරුදු 05-10 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධරයා සම්බන්ධයෙන් ණය ශේෂය රු.50,000/- ක් නොඉක්මවන පරිදි |
| (ii) අවුරුදු 10-20 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධරයා සම්බන්ධයෙන් ණය ශේෂය රු.75,000/- ක් නොඉක්මවන පරිදි |
| (iii ) අවුරුදු 20ට වඩා වැඩි කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධරයා සම්බන්ධයෙන් ණය ශේෂය රු.100,000/- ක් නොඉක්මවන පරිදි |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

03. තවද, ඉහත 02 ඡේදයෙහි සීමා යටතේ කටයුතු කළ නොහැකි ණය ශේෂ පවතී නම්, ඊට හේතු හා ණය අයකර ගැනීමට මෙතෙක් ගනු ලැබූ සියලු පියවර නිශ්චිතව සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි පියවර ගැනීම පිණිස පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ (මුදල්) වෙත 2024.09.30 දිනට ප්‍රථම දන්වා එවිය යුතු ය.

04. 2024.12.31 දින වන විට නීතිමය වශයෙන් කටයුතු කිරීමට/ නඩු පැවරීමට ක්‍රියාමාර්ග ගනු ලබන හෝ නඩු පවරා ඇති හෝ ණය ශේෂ හැර, රජයේ අත්තිකාරම් "බී" ගිණුමේ <u>වර්ෂ 5කට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පවතින කිසිදු ශේෂයක් ඊළඟ මුදල් වර්ෂයට ගෙන යාමෙන් වැළකීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ ගණන් දීමේ නිලධාරීන් වග බලා ගත යුතු ය</u>. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් යම් ගැටලුවක් පවතී නම් පළාත් භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ලබා ගන්නා උපදෙස් අනුව 2024.12.31 දිනට පෙර අදාළ ගැටළුව නිරාකරණය කර ගත යුතු ය.

05. අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දුන් ණය හෝ අත්තිකාරම් මුදල්වලින් පාඩු සිදුවීමක් රජය අපේක්ෂා නොකරන බැවින්, එම ණය හෝ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට ගත යුතු/හැකි සියලු ක්‍රියාමාර්ග ගත යුතු අතරම, ඉහත 02 ඡේදය මඟින් ලබා දී ඇති සීමා යටතේ රජයට අයවිය යුතු හිඟ ණය ශේෂ පොතෙන් අස්කිරීම හෝ අත්හැර දැමීම හෝ සිදු කළ යුතු වන්නේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඒ සඳහා ගත යුතු සියලුම පරිපාලන ක්‍රියාමාර්ග ගෙන ඇති බවට ලිඛිතව සනාථ කළ පසුව හා ඒ අනුව සෑහීමකට පත්වීමෙන් අනතුරුව පමණක් වන බව ද පෙන්වා දෙමි.

06. හිඟ ණය ශේෂ අත්හැර දැමීම සම්බන්ධයෙන් ඉහත 02, 03 සහ 04 ඡේද යටතේ දක්වා ඇති කලසීමාව 2024.12.31 දිනෙන් අවසන් වන බැවින්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීට දකුණු පළාත් සභා මූල්‍ය රීති 62 යටතේ පවරා ඇති රු.5,000/- සීමාව 2025.01.01 දින සිට නැවත බලපැවැත්වෙන බවත්, එදින සිට හිඟ ණය ශේෂ අත්හැර දැමීම සම්බන්ධව එම සීමාව අනුගමනය කළ යුතු බවත් අවධාරණය කරමි.

07. හිඟ ණය ශේෂ අත්හැර දැමීම සඳහා පළාත් භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කරනු ලබන ඉල්ලීම් සියලුම පරිපාලන ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව යොමු කරනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් තහවුරු කරගෙන, පළාත් භාණ්ඩාගාරයේ අනුමැතියට යොමු කරන ඉල්ලීමෙහි ඒ බව සඳහන් කරමින් පෞද්ගලිකව නිර්දේශ කළ යුතු බවත් වැඩිදුරටත් අවධාරණය කරමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් :
1. සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, ගාල්ල. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍ය. විගණන දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - දැ.ගැ.පි.
3. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත. - අ.ක.ස.
4. අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත. - අ.ක.ස.

ප්‍රධාන ලේකම්
2024.07.29 දින සිට
දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා
අනුමැතිය 2024.07.29
ලබා දී ඇති බව සහතික කරමි.
ලේකම් / සහකාර ලේකම් / පනි.

දුරකථන : 091-49 44 007 ෆැක්ස් : 091-22 32 691 විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com